දේශප්‍රේමී ජාතික පෙරමුණ
**PATRIOTIC NATIONALIST FRONT**

102, දෙහිවල පාර, පැපිලියාන, බොරලැස්ගමුව
+94 11 272 0508
+94 70 319 5280
info@djplanka.org
www.djplanka.org

2022.04.05

ගෞරවනීය ස්වාමීන්වහන්ස,

පූජකවරුන් සහ අන්‍යාගමික නායකවරුනි,

මහජන නියෝජිතයනි,

දේශප්‍රේමී රට වැසියනි,

**දේශපාලන සහ ආර්ථික අස්ථාවරභාවයෙන් රට අරාජික වීම වැලැක්වීම සඳහා දේශප්‍රේමී ජාතික පෙරමුණ විසින් යෝජනා කරනු ලබන වැඩපිළිවෙල.**

දරාගත නොහැකි ආකාරයට බඩු මිල ඉහල යෑම, විදුලි කප්පාදුව, ඉන්ධන හිඟය සහ ගෑස් හිඟය නිසා පීඩාවට පත් ජනතාව විසින් රජයට එරෙහිව අරගලයකට පිවිසීමට කටයුතු කිරීම අතිශය සාධාරණ තීරණයකි. කෙසේ වුවද ආණ්ඩුවට එරෙහි අරගලය රට අරාජිකත්වය කරා ගෙන යෑමට නොව ජනතාව ඉල්ලා සිටින සහන, දේශපාලන සහ ආර්ථික ප්‍රතිසංස්කරණ ඉලක්ක කරගත යුතුය.

වර්තමාන ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව ජනාධිපතිවරයා ඉල්ලා අස්වීමෙන් හෝ වෙනයම් ආකාරයකින් ධූරය නතර වීමකදී සිදුවන්නේ අනුප්‍රාප්තික ජනාධිපතිවරයකු පාර්ලිමේන්තුවෙන් පත්වීමයි. ඒ අනුව ජනාධිපතිවරයාට ඉල්ලා අස්වීමට බලකරන පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂ ජනාධිපතිධූරය සඳහා තමන් විසින් යෝජනා කරන සුදුසු මන්ත්‍රීරයා ජනතාවට හෙළි කල යුතුය.

මේ අවස්ථාවේදී මහා මැතිවරණයක් පැවත්විය යුතුයැයි ජනතාව සහ විපක්ෂයේ කණ්ඩායම් ඉල්ලා සිටින්නේ නම් මහා මැතිවරණයක් සඳහා පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 70 ව්‍යවස්ථාව අනුව 2022 මාර්තු වන තෙක් ජනාධිපතිවරයාට බලයක් නැත. එය කල හැක්කේ පාර්ලිමේන්තුවේ බහුතර යෝජනාවකින් ජනාධිපතිවරයා වෙත කරනු ලබන ඉල්ලීමක් මත පමණි. ඒ අනුව මහ මැතිවරණයකදී ජනතා මතය උරගා බැලිය යුතුයැයි කියනු ලබන පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂ පාර්ලිමේන්තුව තුල ඒ සඳහා යෝජනාවක් ඉදිපත් කල යුතුය.

1978 ව්‍යවස්ථාව තුල ජනාධිපතිධූරය ව්‍යවස්ථාදායකයෙන් ස්වාධීනව ස්ථාපිත කර ඇත්තේ දේශපාලන ස්ථාවරත්වය තහවුරු කිරීමේ පදනම ඇතිවයි. ඒ අනුව පාර්ලිමේන්තුව තුල අගමැති ප්‍රමුඛ ආණ්ඩුවක් පිහිටුවීම සඳහා බාධාවක් නොමැති අතර 2001 දිත් 2019 දිත් විධායක ජනාධිපති සහ පාර්ලිමේන්තුව ප්‍රතිවිරුද්ධ පාර්ශවයන් නියෝජනය කරන තත්වයක් ඇතිවිය. මෙවැනි තත්වයක් තුල මුල්‍ය පාලන බලය පාර්ලිමේන්තුව සතුවන නිසා ජනාධිපතිවරයාගේ ව්‍යවස්ථාපිත බලය සීමා වන අතර ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සම්පාදකයන් අපේක්ෂා කළ සංවරණය සහ තුලනය ඇතිවීමෙන් ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් වේ. මේ සඳහා පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂ හා කණ්ඩායම් තනි තනිව හෝ සන්ධානගතව ආන්ඩුවක් පිහිටවීම සඳහා බහුතරය පෙන්වීම අවශ්‍ය වේ.

අ.පි.බ

කෙසේ වුවද ඉහත නිශ්චිත ක්‍රියාමාර්ගයකට එළැඹීමට පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂ ඉදිරිපත් නොවන්නේ නම්, භූදු අඛණ්ඩ අරගලය අවසානයේදී උභතෝකෝටිකයකට මැදිව රට අරාජිකත්වයට පත් වීම වැලැක්විය නොහැක.

එසේ හෙයින් පවතින ආර්ථික සහ දේශපාලන අර්බුදය උග්‍රවීමෙන් රටතුල පැවතිය යුතු කෙටි කාලීන සහ දිගු කාලීන දේශපාලන සහ ආර්ථික ස්ථාවරත්වය ඇති කිරීම සඳහා පහත සඳහන් ජාතික සම්මුතිය ඇති කිරීමට සංවිධානාත්මක ජනමතයක් සහ දේශපාලන පක්ෂද ඇතුලු සියලු බලවේග පෙළගැස්වීම සඳහා කටයුතු කල යුතු බවට අපි යෝජනා කරමු.

01

**ජාතික ආර්ථික ප්‍රතිපත්තිය**

1. ජාතික ආර්ථික ප්‍රතිපත්තිය ,ආර්ථික ස්වාධිපත්‍යය තහවුරු කරන ආර්ථික සුරක්ෂිතබව සහ කෘෂිකර්මය කේන්ද්‍රිය වු ආනයන ආදේශන පදනම් වු පාරිභෝගිකවාදය අවම කරන, ඉන්දියානු සාගර කලාපය සාම කලාපයක් බව සහතික කරන, නොබැඳි විදේශ ප්‍රතිපත්තිය තහවුරු කරන ආර්ථික දර්ශනයක් මත පදනම් විය යුතුය. පහත යෝජනා කරන ජාතික විධායක ආර්ථික සභාවේ කෙටි කාලීන සහ දිගු කාලීන සැලසුම් මෙම ආර්ථික ප්‍රතිපත්තිය ප්‍රවර්ධනය කිරීම සඳහා විය යුතු අතර ඊට අනුකූල විය යුතුය.

02

**ජාතික විධායක ආර්ථික සභාව**

1. රටේ ආර්ථිකය ගොඩ නැගීම සඳහා කෙටි කාලීන සහ දිගු කාලීන සැලැස්මක් සකස් කිරීම සඳහා ආර්ථිකය, දේශපාලනය සහ විදේශ සම්බන්ධතා පිළිබඳව දැනුමක් ඇති විධායක සභාවක් පිහිටවිය යුත්තේය.

2. එම සභාව පාර්ලිමේන්තුවේ 2/3 ක යෝජනාවකින් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ කොටසක් ලෙස ස්ථාපිත කල යුත්තේය.

3. එම සභාව විසින් ආර්ථික කාර්යක්ෂමතාව, සමාජ සාධාරණත්වය සහ පාරිසරික තිරසාරත්වය ඉලක්ක කරගත් සාර්ව ආර්ථික වැඩ පිළිවෙලක් ජාතික ආර්ථික ප්‍රතිපත්තියට අනුකූලව සකස් කල යුතුය.

4. ජාතික ආර්ථික විධායක සභාව විසින් සකස් කරන ලද ආර්ථික වැඩ සටහන පාර්ලිමේන්තුවේ 2/3 කින් අනුමත කර **"ජාතික ආර්ථික සම්මුතිය"** ලෙස සම්මත කල යුතුය.

5. එම වැඩසටහන කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා පස් අවුරුදු වැඩ පිළිවෙලක් අන්තර්කාලීනව ඉදිරිපත් කල යුතුය.

6. ජාතික විධායක ආර්ථික සභාව විසින් වාර්ෂික ආර්ථික ඉලක්කයන් ස්ථාපනය කල යුතු අතර වාර්ෂිකව එහි ප්‍රගතිය සමාලෝචනය කර අවශ්‍ය වෙනස් කම් සහිතව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල යුතුය.

7. පවතින පාර්ලිමේන්තුව සහ ඉදිරියේදී පත්වන පාර්ලිමේන්තුව නීතී සම්පාදනය සහ අරමුදල් අනුමත කල යුත්තේ ජාතික විධායක සභාව විසින් සකස් කරන ආර්ථික වැඩ පිළිවෙල බලගැන්වීම සඳහ පමණක් විය යුතුය.

8. අමාත්‍ය මණ්ඩලය වහා විසුරුවා හැර පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂ වලින් සීමිත අමාත්‍යවරු සංඛ්‍යාවකින් යුත් අන්තර් කාලීන ආණ්ඩුවක් පත්කල යුතුය. ජාතික ආර්ථික විධායක සභාව විසින් සකස් කරන ලද පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද ජාතික ආර්ථික සම්මුතිය බලාත්මක කිරීම ජනාධිපතිවරයා සහ අන්තර් කාලීන අමාත්‍ය මණ්ඩලය සතු වගකීම වන්නේය.

9. ජාතික සම්මුතිය බලාත්මක කිරීම ඉදිරියේදී පැවත්වෙන මැතිවරණවලදී බලයට පත්වන රජයන් විසින් ක්‍රියාත්මක කළ යුත්තේය.

අ.පි.බ

## 03
## මූලික ආර්ථික ප්‍රමුඛතා

1. ආහාර සුරක්ෂිතබව කේන්ද්‍ර කරගත් දේශීය යෙදවුම් පදනම් වූ කෘෂි කර්මාන්තය ස්ථාපනය කිරීම.

2. දේශීය අමුද්‍රව්‍ය සහ යෙදවුම් අගය වැඩි ආනයන ආදේශන කර්මාන්ත ස්ථාපනය කිරීම සහ ඊට අවශ්‍ය බදු සහ බදු නොවන ආරක්ෂණය ලබාදීම.

3. දේශීය ඛණිජ සම්පත් පදනම් වූ අගය වැඩි කිරීමේ නිෂ්පාදන සඳහා වූ බැර කර්මාන්ත ඇති කිරීම.

4. බලශක්ති ස්වාධිපත්‍ය තහවුරු කරමින් සූර්ය බලශක්තිය, ජල විදුලි බලය සහ සුළං බලය පදනම් වූ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගේ බලශක්ති දායකත්වය 80% ක් දක්වා වැඩි කිරීම.

5. (ආහාර ක්‍රමය) දේශීය වෙදකම ප්‍රචලිත කරමින් ග්‍රාමීය වෛද්‍ය මධ්‍යස්ථාන පිහිටවීම මගින් නිරෝගී ශ්‍රම බලකායක් ඇති කිරීම සහ ඖෂධ ආනයන වියදම් සඳහා විකල්ප හඳුන්වා දීම.

6. තරුණ සහ කාන්තා ශ්‍රම බලකාය රැකියා අභිමුඛ නිපුණතා මගින් බල ගැන්වීම මගින් ඔවුන්ට දේශීය සහ විදේශීය ශ්‍රම වෙළඳපල තුල ඉහල වැටුප් ලබාදීම සහ ස්වයං රැකියා සඳහා ණය සහ ප්‍රාග්ධන ආධාර, ව්‍යාපාරික දැනුම අඛණ්ඩව ලබාදීම සහ නිෂ්පාදන සඳහා වෙළඳ පල පුළුල් කිරීමට කටයුතු කරන ආයතනයක් ප්‍රාදේශීය මට්ටමින් පිහිටවීම.

7. සාමුහිකත්වය පදනම් වූ ග්‍රාමීය ආර්ථික සභාවක් පිහිටවීම මගින් ග්‍රාමීය ආර්ථිකය තුල ජනතා සහභාගිත්වය සහ අයෝජනය ඉහල නැංවීම.

8. රාජ්‍ය සේවයේ ශ්‍රම අවශ්‍යතාව වහාම සංගණනය කර අතිරික්ත සේවකයන් පෞද්ගලික අංශය සහ රාජ්‍ය අංශය එක්ව කෙරෙන ව්‍යාපෘති සහ පුද්ගලික අංශයේ ව්‍යාපෘති සඳහා අනුයුක්ත කිරීම.

## 04
## නීතියේ ආධිපත්‍යය

ආර්ථික සහ දේශපාලන ස්ථාවරත්වය තහවුරු කිරීම සඳහා මෙන්ම ජනතා විශ්වාසය ආරක්ෂා කිරීම සඳහා නීතියේ ආධිපත්‍ය තහවුරු කිරීම අත්‍යාවශ්‍ය වේ. ඒ සඳහා

1. දේශපාලඥයන් සහ සියලුම රජයේ සේවකයන්ට මහජන ධුරයේ ගෞරවය ආරක්ෂා කිරීම බලකරන , එසේ නොකිරීම ධුරය අහිමි වීම හා දඩ මුදල් ඇතුලත් දඬුවම් සහිත නීතියෙන් බලාත්මක කල හැකි ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දීම.

2. දේශපාලඥයන් සහ රාජ්‍ය සේවකයන් විසින් ගනු ලබන තීන්දු සහ තීරණවලින් පැනනගින මූල්‍යමය හා මූල්‍යමය නොවන් අලාභයන් සඳහා ප්‍රතිපල සඳහා ඔවුන් වගකීව යුතු බව සහතික කරන නීති පද්ධතියක් ස්ථාපිත කිරීම.

3. දැනට පවතින  අසීමිත අක්‍රමිකතා සහ දූෂණ වල ප්‍රමාණය නිසා ඒ සඳහා මහාධිකරණයට සමාන බලතල ඇති විනිසුරුවන් තිදෙනකුට සමන්විත විශේෂිත අධිකරණ දෙකක් පිහිටවීම

එම අධිකරණ සඳහා නීතිපති දෙපාර්තමේන්තුව සහ විගණන දෙපාර්තමේන්තුවට අනුබද්ධව විශේෂ විමර්ශන ඒකකයක්  පිහිටවිය යුතු බවට ද එම අධිකරණයට පැමි❑ලි කිරීමේ බලය සෑම පුරවැසියකුම සතු විය යුතුය.

එම අධිකරණය විසින් උපයාගත් ආකාරය හෙළිදරවු කල නොහැකි සහ රාජ්‍ය මුල්‍ය වංචාවන් සම්බන්ධයෙන් නඩු විභාග කිරීම, දඬුවම් කිරීම සහ වරදකරුවන් සතු දෙස් විදෙස්  වත්කම් පවරා ගත හැකි පරිදි අතීතයට බලපවත්නා පරිදි නීති සම්පාදනය කල යුතුය.

4. රාජ්‍ය මුල්‍යය විධිමත් ලෙස උපයෝජනය කරන බවට සහතික කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව හා සමාන   පරීක්ෂණ බලතල සහිත ව්‍යවස්ථාදයකට වගකියන ස්වාධීන විගණන දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කිරීම. මුල්‍යමය වංචාවන් සහ නොසැලකිලිමත් ලෙස රාජ්‍ය මුදල් නාස්තිකිරීම සම්බන්ධයෙන් නඩු පැවරීමේ වගකීම විගණන දෙපාර්තමේන්තුවට තිබිය යුතුය.

4. රාජ්‍ය ආයතන වල සේවා ප්‍රමිතීන් සහ කාල නිර්ණයන් ස්ථාපිත කිරීම සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය විවෘත කිරීම මගින් අකාර්යක්ෂමතා හේතුවෙන් ඇතිවන ආයතනික අක්‍රමිකතා වැලැක්විය යුතු බවට ද (උදා. වශයෙන් පලාත් පාලන ආයතන වල සැලසුම් අනුමත කිරීම සඳහා නියමිත තොරතුරු ජනතාවට පූර්ව වශයෙන්ලබා දීම සහ සැලසුම් අනුමත කිරීම නියමිත කාල රාමුවක් තුල කල යුතු බවට නියමයන් පැනවීම)

6. ආයතනික වශයෙන් විය හැකි වංචනික බැඳියාවන් (කුද්‍රෘනයන්) වැලැක්වීම සඳහා සංවරණ හා පරීක්ෂණ ක්‍රම වේදයන් සහ පරිචයන් නීතිමය අධිකාරයෙන් බල ගැන්විය යුතුය.

## 05
## විදේශ ආයෝජන සහ ගිවිසුම්

1. සියලු ජාත්‍යන්තර ගිවිසුම් ජාතික ආර්ථික සම්මුතියට අනුකූලවන බවට ආර්ථික විධායක සභාව සහතික කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවේ පූර්ව අනුමැතියට යටත් ව ක්‍රියාත්මක කල යුතුය.

2. සෑම විදේශ ගිවිසුමක්ම බලපවත්නා කාලය උපරිම වසර 20 ක් දක්වා සීමා විය යුතු අතර දීර්ඝ කිරීම නැවත සලකා බැලීමකින් පසුව පමණක් විය යුතුය.

3. දැනට ආර්ථික මර්මස්ථාන සහ කේන්ද්‍රිය ආර්ථික සේවාවන් සම්බන්ධයෙන් අත්සන් කර ඇති විදේශ ගිවිසුම් ජාතික ආර්ථික සම්මුතියට අනුකූලව නැවත සමාලෝචනය කර සපුරා අවලංගු කිරීමට හෝ රටට වාසි සහගත ලෙස සංශෝධනය කල යුතුය.

නුවන් බැල්ලන්තුඩාව

.....................................

නීතීඥ නුවන් බැල්ලන්තුඩාව
ලේකම්
දේශප්‍රේමී ජාතික පෙරමුණ